දමන ප්‍රාදේශීය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත කිරීම**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 02 වැනි දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 ජුලි 31 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 06 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව නොවීම.**

**------------------------------------------------------------------**

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීඒ/ශ්‍රීලරාඅගිප්‍ර දරන පලාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙළඳ බලපත්‍ර ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වෙළඳ බලපත්‍ර ආදායම රු.101,850 ක් වුවද ශේෂ පත්‍රයට එය රු.100,450 ලෙස ගෙන තිබුණි. ඒ අනුව හිඟ හිටි වෙළඳ බලපත්‍ර ආදායම රු.1,400 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) හිඟහිටි මුද්දර ගාස්තු ගිණුමේ ආරම්භක ශේෂයක් නිවැරදිව ගෙන නොතිබුණු නිසා සමාලෝචිත වර්ෂයේ අවසාන හිඟහිටි මුද්දර ගාස්තු ආදායම රු.196,850 ක් ශේෂ පත්‍රයේ වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ආදායම් වෙනුවෙන් තැන්පතු ලෙස ආදායම් ලෙජරවල දක්වා ඇති ටෙන්ඩර් තැන්පතු සහ අනෙකුත් තැන්පතු වල වටිනාකම රු.139,978 ක් වුවද, එය ශේෂ පත්‍රයට රු.130,024 ක් ලෙස ගෙන තිබුණි.

(ඇ) ආදායම් ලෙජරය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී ආදායම රු.414,362 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.381,219 ක් ලෙස රු.33,143 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවා නියුක්තීන්ගේ භාර අරමුදල හා සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල රු.16,934 ක්වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.198,029 ක් ලෙස රු.181,095 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ආදායම රු.869,760 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.702,610 ක් ලෙස දක්වා තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ අක්කර බදු ආදායම රු.167,150 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ප්‍රවාහන සම්බන්ධතා අවශ්‍ය හා වෙනත් සේවා සඳහා උපචිත වියදම රු.26,756 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

-----------------------

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින් එම වටිනාකම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පරීක්ෂා කිරීමට නොහැකි විය.

| **විෂයය** | **වටිනාකම** | **ඉදිරිපත් නොකළ සාක්ෂි** |
|---|---|---|
| | රු. | |
| ජරාවාස ගොඩනැගිලි අලුත්වැඩියාව | 62,467 | - අලුත්වැඩියා වියදම් විස්තරය |
| හිඟහිටි අක්කර බදු | 702,610 | - හිඟහිටි අක්කර බදු ලේඛණය |

1.3.4 **ගෙවිය යුතු ගිණුම්**

2013 දෙසැම්බර් 31 වන විට පළාත් පාලන සේවයේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපට ගෙවිය යුතු මුදල රු.111,721 වුවත්, මෙම මුදල ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

1.3.5 **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

පහත සඳහන් නීති,රීති,රෙගුලාසිවලට හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **ප්‍රාදේශීය සභා රීති මාලාව** | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයින් පිළිබඳව ලැයිස්තුවක් එක් එක් කාර්තුව අවසානයේදී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර සභාපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 59 - 66 | සෑම වර්ෂයකම ආරම්භයේ දී ආදායම් පරීක්ෂක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් ප්‍රදේශය තුල පරීක්ෂනයක් පවත්වා කර්මාන්ත බදු අයකල යුතු ආයතන හඳුනාගෙන ඒවා අයකර ගැනීමට කටයුතු කලයුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. |

(iii) රීති 153 ආදායම් හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශයක්, පී.එස්.07 ආකෘති පත්‍රය ප්‍රකාරව පවත්වා ගෙන ගොස් නොතිබුණි

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.201,337 ක් වූ අතර , ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.188,145 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,192 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2013 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු. 1,295,200 ක් රෙජිස්ට්‍රාර් ජෙනරාල්ගෙන් ද උසාවි දඩ රු. 249,483 ක් නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ද ලැබිය යුතුව තිබුනු අතර එම මුදල් අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් මෙහෙයුම් අකාර්යක්ෂමතා නිරික්ෂණය විය.

(අ) 2013 අප්‍රේල් 20 වෙනි දින සභා භූමිය තුල කසල වර්ගීකරණය සඳහා රු.3,811,016 ක වියදමක් දරා සකස් කරනලද ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි, පරිත්‍යාගවල පිරිවැය ස්ථාවර වත්කම් ලේඛණයේ දක්වා නොතිබීමත් තැන්පතු ලේඛණයේ ආරම්භක ශේෂයන් විස්තර සහිතව ඉදිරියට ගෙනවිත් නොතිබීමත් වෙළඳ බලපත්‍ර ලේඛණයේ බලපත්‍ර අංකය, වාර්ෂික ගාස්තුව, අධි ගාස්තුව හා එකතුව යන තීරු සම්පූර්ණ කර නොතිබීමත් පොදු ලෙජරය නිසිපරිදි නඩත්තුකර නොතිබීමත් හේතුවෙන් ලේඛණ පවත්වාගෙන යාම දුර්වල මට්ටමක පැවතුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) දේශිය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබුනු ණය කාලයක් තිස්සේ නොගෙවීම නිසා රු.120,303 ක දඩ පොලියක් ගෙවීමට සිදු වී ඇත.

(ආ) සභාව විසින් දේශිය ණය සහ සංවර්ධන අරමුදලෙන් රු.1,950,000 ක ණය මුදලක් ලබාගෙන තිබුනු අතර, එම ණය මුදලට අදාල පොලිය සහ වාරික 2006 දෙවන කාර්තුවේ සිට නොගෙවීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට හිඟ ඇති ණය ප්‍රමාණය රු.1,164,785 ක් හා හිඟ ණය පොලී රු.398,113 ක් වශයෙන් රු.1,562,898 ක් ගෙවීමට ඇත.

(ඇ) කාර්තුමය වශයෙන් දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවට මුද්දර ගාස්තු යැවිය යුතු වූවද 2012 වර්ෂය වෙනුවෙන් රු.35,152 ක මුද්‍ර ගාස්තු ද 2013 වර්ෂය වෙනුවෙන් රු.69,674 ක මුද්දර ගාස්තු දේශිය ආදායම්බදු දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි.

**4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයක් නිරික්ෂණය වුයෙන්, අයවැය ලේඛණයේ සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරික්ෂණය විය.

5. **පද්ධති හා පාලනය**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පරිදි පහත සඳහන් පද්ධති හා පාලන සම්බන්ධ අඩුපාඩු පිළිබඳ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අක්කර බදු අයකර ගැනීම

(ආ) ආදායම් ණයගැතියෝ

(ඇ) ලේඛණ පවත්වාගෙනයාම